**පාතදුම්බර ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය.
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වු මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.
-------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

සමාලෝචිත වර්ෂයේ ඉදි කිරීම් විෂයයන් 02 ක් සඳහා වැය කළ රු.175,000 ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, සභාව සතු ඉඩම් 37 ක් හා නළ ළිං 77 ක වටිනාකම තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසදුණු පාලන ගිණුම්
------------------------------

ගිණුම් විෂයයන් 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා ලෙජර් ගිණුම් ශේෂ අතර රු.678,645 ක නොසැසදීමක් අනාවරණය විය.

#### 1.3.3 ලැබිය යුතු ගිණුම්
--------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක එකතු වටිනාකම රු.49,730,284 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.9,139,640 ක් වී තිබුණි.

#### 1.3.4 ගෙවිය යුතු ගිණුම්
---------------------

2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,990,527 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකමින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.2,339,003 ක් විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ගිණුම් විෂයයන් 03 ක අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.32,303,404 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නිති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත. | |
| | 132(ඒ) | විෂයයභාර අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමැතියකින් තොරව පෙර පාසල් ළමුන් සඳහා පාසල් ගමන් මලු ලබා දීම වෙනුවෙන් රු.42,000 ක් වැය කර තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති. | |
| | 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරික්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) | 571(2) | අවස්ථා 68 කදී තැන්පත් කරන ලද රු.1,432,267 ක ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) | 1645 | 2014 ජූනි 27 දින සිට 2016 පෙබරවාරි 25 දින දක්වා අංක 32 – 4636 දරන වාහනයේ ධාවන සටහන් නඩත්තු කර නොතිබූ අතර, එම කාල පරිච්ඡේදය තුළ කි.මී.12247 ක් වූ ගමන් සඳහා ඉන්ධන ලීටර් 306 ක් වෙනුවෙන් රු.36,169 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.30,987,773 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.18,675,194 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,312,579 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ආදායම් රැස් කිරිමේ කාර්යය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට හිග ශේෂය | ඉදිරියට ලැබීම් | 2015 වර්ෂය බිල් කිරීම් | අධි ගාස්තු | දූන් වට්ටම් | 2015 ලැබීම් හිගයෙන් ලැබීම් | 2015 බිල් කිරීම්වලින් ලැබීම් | 2015.12.31 දිනට හිග ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,412,398 | 519,586 | 5,616,848 | 233,324 | 182,159 | 983,965 | 3,186,342 | 3,390,518 |
| කුළී ආදායම | 389,847 | -- | 3,336,140 | -- | -- | 39,816 | 3,284,840 | 401,331 |
| බලපත්‍ර ගාස්තු | -- | -- | 2,358,260 | -- | -- | -- | 2,358,260 | -- |
| වෙනත් ආදායම් | 22,882,518 | -- | 37,008,522 | -- | -- | 17,542,947 | 6,357,086 | 35,991,007 |
| | | | | | | | | --------------- |
| එකතුව | | | | | | | | 39,782,856 |
| | | | | | | | | ======== |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.39,782,856 ක මුළු ආදායමක් හිග හිට තිබුණි.

## 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.2,412,398 ක හිග ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.5,616,848 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය හිග ශේෂයෙන් සියයට 40 ක් හා බිල් කිරීම්වලින් සියයට 58 ක් විය. 2015 දෙසැම්බර් 31 දිනට හිග ශේෂය රු.3,390,518 ක් වූ අතර, එම ශේෂයෙන් වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.1,428,433 ක් විය.

## 2.2.3 ජල ගාස්තු.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග ජල ගාස්තු රු.382,701 ක් වූ අතර, එම ශේෂයෙන් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ මුදල රු.93,849 ක් විය..

(ආ) 2015 ජනවාරි 01 දිනට පෙර සිට ක්‍රියාත්මක නොවන මීගම්මන යටවර ජල යෝජනා ක්‍රමයේ රු.25,210 ක හිග ජල ගාස්තු ආදායමක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.252,698 ක් හා මුද්දර ගාස්තු රු.35,355,608 ක් ලැබියයුතුව පැතුණි. එම ශේෂයෙන් වසරකට වැඩි කාලයක් හිග හිටි ශේෂය රු.5,245,722 ක්ව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

නාපාන ශ්‍රවණාගාරයේ ජනෙල්, දොරවල්, උළුවහු යනාදිය දිරාපත් වෙමින් පැවති අතර, ශ්‍රවණාගාරය සතු පුටු යනාදිය ද අබලන් තත්ත්වයේ පැවතීමෙන්, ශ්‍රවණාගාරයෙන් ඵලදායී කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වන විට රු.27,955,343 ක් වැය කර පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමෙහි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදි කර ඇතත්, එම ගොඩනැගිල්ල පිහිටි හෙක්ටයාර් 0.1028 ක ඉඩම් කොටස 2016 මැයි 31 දින වන විටත් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂ 03 ක් තුළ ගොඩනැගිලි අයදුම්පත් ඉල්ලුම් කළ සංඛ්‍යාව 728 ක් වූ අතර, අනුමත කළ සංඛ්‍යාව 585 ක් විය. එහෙත්, වර්ෂ 03 තුළම අනුකූලතා සහතික 93 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ඇ) 2004 වර්ෂයේ ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරියෙකුගෙන් අය වියයුතු රු.33,886 ක ණය මුදලක් 2016 මැයි 31 දක්වාම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නාපාන ශ්‍රවණාගාරය ඉදිරිපිට මාර්ගයේ 25′.0"x21′.0" ප්‍රමාණයේ තහඩු සෙවිලි කර ඉදිරිපස වීදුරු දොරවල් යොදා ව්‍යාපාරයකට සුදුසු ලෙස ගොඩනැගිල්ලක් ප්‍රාදේශීය සභාවේ අවසරයකින් තොරව ඉදි කර තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය මධ්‍යයේ සිට 28′.0" ක් දුරින් ගොඩනැගිල්ල ඉදි කර තිබූ අතර, සභාව ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය.**

**3.3.1 මඩවල වෙළඳ සංකීර්ණය අලුත්වැඩියාව - රු.336,808**

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 පෙබරවාරි 25 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී පහත කරුණු අනාවරණය විය.

(අ) ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 02 අනුව යෙදියයුතු ජනේල රාමුව 4′X3" ප්‍රමාණයෙන් දැව යොදා කළයුතු වුවත්, 3 ½ "X2 ½ " ප්‍රමාණයේ දැව භාවිතා කර ඉදි කර තිබුණි.

(ආ) ඉහළ මාලයේ ඇතුළත කඩ කාමරවලට ආලෝකය ලබා ගැනීමට කොන්ක්‍රීට් වහළයේ 15′.0"X2′.0" ප්‍රමාණයේ කොටසක් කඩා ඉවත් කර ඇතත්, වැර ගැන්නුම් වාතයට නිරාවරණය වී තිබුණි. මේ නිසා, එම කම්බි අව්වට වැස්සට හසු වී දිරාපත් වෙමින් පැවති අතර, මෙයින් ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් වහලයේ පැවැත්මට හානි සිදු වීමේ ඉඩකඩක් පැවතුණි.

## 3.3.2 අඹතැන්න පොදු වැසිකිළිය අලුත්වැඩියාව - රු.849,188

----------------------------------------------------------------

වැසිකිළියකට ජලය අත්‍යවශ්‍ය සාධකයක් වුවත්, ජල සම්බන්ධතාවය දිගු කලක සිට අත් හිටුවා තිබූ අතර, වැසිකිළියේ අලුත්වැඩියාව නිම කර වර්ෂයකට ආසන්න කාලයක් ගත වී තිබුණ ද, භාවිතයට ගැනීමකින් තොරව විනාශ වීමට ඉඩ හැරීම නිසා, දරන ලද රු.844,188 ක මුදල නිශ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

## 3.3.3 සාලවන විහාරය ඉදිරිපිට සරසවි මාවත සංවර්ධනය කිරීමේ කර්මාන්තය රු.1,119,608

--------------------------------------------------------------------------------------

මේ පිළිබඳව 2016 පෙබරවාරි 25 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේ රු.1,119,608 ක මුදලක් වැය කර මාර්ගයට ආසන්නව ගලා යන ඇළ මාර්ගයකින් මාර්ගයට සිදු වන හානිය වළකා ගැනීමට මාර්ගයට ආරක්ෂිතව ඉදි කර තිබූ ආරක්ෂක බැම්ම ඉදි කිරීම නිම වී මාස 10 කට පසුව යාබද ඇළ මාර්ගයට සම්පූර්ණයෙන් පෙරළී කැඩී බිඳී ගොස් තිබුණි.

(ආ) මාර්ගයට යාව ආරක්ෂිත බැම්ම ඉදි කර තිබූ පෙදෙස ඇළ මාර්ගය වංගුවක් සහිත පෙදෙසක් බැවින්, ඉහළ සිට පැමිණෙන ජල ධාරාවන් සෘජුව ආරක්ෂක බැම්ම දෙසට ගලා ඒම වැළකෙන පරිදි බැම්මේ ශක්තිය ඇති වන ආකාරයට ඉදි කළයුතු වුවත්, ඒ ගැන සළකා බලා නොතිබුණි.

(ඇ) යථෝක්ත ආරක්ෂක බැම්ම සඳහා වැරගැන්නුම් දගර වානේ (කම්බි) රහිතව කොන්ක්‍රීට් පමණක් භාවිතා කිරීමට ඇස්තමේන්තු කර ඉදි කර තිබූ අතර, ඒ හේතුවෙන් බැම්ම කොටස්වලට කැඩී ඇළ මාර්ගයට ඇද වැටී ඇති බවක් නිරීක්ෂණය විය.

(ඈ) ඇළ මාර්ගයට හා ආරක්ෂිත බැම්මට හානි වීමට ඇති ඉඩකඩ හඳුනා ගෙන එම කටයුතු නවතාලීමට කටයුතු කර නොතිබූ අතර, එසේම, ඉදි කිරීමට ප්‍රථම ඒ සම්බන්ධව පවතින අවදානම හඳුනා ගැනීමට කටයුතු කර ද නොතිබුණි.

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

## 4.1 අයවැය පාලනය.

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 05 ක සියයට 24 සිට සියයට 92 දක්වා ද, වියදම් විෂයයන් 02 ක සියයට 31 සිට සියයට 68 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වු අතර, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය.**

--------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

-------------------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) රු.1,260,000 ක් වටිනා වාහන 03 ක් වසර 03 සිට වසර 08 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පවත්නා අතර, එම වාහන යථා තත්ත්වයට පත් කර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.9,000,000 ක් වටිනා වාහන 02 ක් හා යන්ත්‍රයක් භාවිතයට ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතිණි.

(ඇ) මඩවල වෙළඳ සංකීර්ණයේ ඉදි කර තිබූ කඩ කාමර 12 න් කඩ කාමර 07 ක් වසා දමා තිබුණි. ව්‍යාපාරයන් සඳහා උචිත වන පරිදි හා ගනුදෙනුකරුවන්ට පහසුවෙන් පැමිණිය හැකි පරිදි ඉදි නොකිරීම හා අවිධිමත් ලෙස ඉදි කිරීම් හේතුවෙන්, ව්‍යාපාර සඳහා සුදුසු මට්ටමේ නොතිබුණි.

**5. පද්ධති හා පාලනය.**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණයගැති/ණයහිමි පාලනය
(ඉ) තොග පාලනය
(ඊ) කොන්ත්‍රාත් පාලනය